# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.22 පැය 1400 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 118 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද වියළි කහ තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නොරොච්චෝලය පොලිස් ස්ථානය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව, 2025.01.21 වන දින උදෑසන නොරොච්චෝලය පොලිස් වසමේ ඉලංතඩිය ප්‍රදේශයෙදී නොරොච්චෝලය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද උර 51 ක අසුරන ලද කහ කිලෝ ග්‍රෑම් 2,021 ක් හා කැබ් රථයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වූ කල්පිටිය පාර, තිහලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම කහ තොගය ඉලංතඩිය මුහුදු තීරයෙන් නීති විරෝධීව මෙරටට ගෙන්වා ඇති බවට අනාවරණය වී ඇති අතර සැකකරු විසින් කහ තොගය කැබ් රථයකින් ප්‍රවාහනය කරමින් සිටියදී නිලධාරීන් විසින් ලුහුබැඳ ගොස් මෙසේ අත්අඩංගුවට ගෙන ඇත.

නොරොච්චෝලය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**මෙම වැටලීමට අදාළ ඡායාරූපයක්**



**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**